# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2322/55 - 2023 මාර්තු මස 09 වැනි බ්‍රහස්පතින්දා - 2023.03.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත**

22අ වගන්තිය යටතේ වූ නියමය

සංශෝධිත 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 22අ වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති රනිල් වික්‍රමසිංහ වන මම, මෙහි පහත සඳහන් උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ප්‍රදේශය, මේ පනතේ කාර්යය සඳහා බලපත්‍රලත් කලාපයක් ලෙස මේ නියමය මගින් මෙයින් ප්‍රකාශයට පත් කරමි.

රනිල් වික්‍රමසිංහ,
ජනාධිපති.

2023 මාර්තු මස 07 වැනි දින,
කොළඹ,
ජනාධිපති කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, එරාවූර් පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 193, තලවයි ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පුන්නෙයිකුඩා ග්‍රාමයේ පිහිටා ඇත්තාවූ ද පුන්නෙයික්කුඩා තෝට්ටම් යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා සර්වේයර් ජනරාල්වරයා විසින් පිළියෙල කරන ලද 2020 ජුනි මස 24 වන දිනැති මූලික පිඹුරු මඩ 3017 දරන පිඹුරේ කැබලි අංක 1, 6, 10 සහ 12 ලෙස ලකුණු කර නිරූපණය කර ඇත්තා වූ ද,

**කැබලි අංක 01**

| | |
|---|---|
| *උතුරට* | : හිමිකම් පිඹුරු 47624, හිමිකම් පිඹුරු 164638 සහ තලවයිකාඩු රජයේ ඉඩමද ; |
| *නැගෙනහිරට* | : තලවයිකාඩු රජයේ ඉඩම සහ මූලික පිඹුරු මඩ 345හි කැබලි අංක 6 ද ; |
| *දකුණට* | : මූලික පිඹුරු අංක මඩ 345 හි කැබලි අංක 6, මෙම පිඹුරේ කැබලි අංක 2 සහ 3 ද ; සහ |
| *බටහිරට* | : මෙම පිඹුරේ කැබලි අංක 2 සහ 3, හිමිකම් පිඹුරු 47624 සහ හිමිකම් පිඹුරු 164638 ද. |


1A - G 39072 — 08 (2023/03)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

යන මායිම් තුළ පිහිටි අක්කර පනස්හයයි රූඩ් තුනයි පර්චස් තිස් එකයි දශම දෙක (අ. 56, රූ. 03, පර්. 31.2) ක් හෙවත් හෙක්ටයාර් විසිතුනයි දශම බින්දුවයි හතරයි හතරයි තුනක් (හෙක්ටයාර් 23.0443) කින් සමන්විත වූ කැබලි අංක 1 ලෙස සලකුණු කර ඇති ඉහත කී බෙදා වෙන්කල ඉඩම් කොටස වේ.

**කැබලි අංක 06**

*උතුරට* : මූලික පිඹුරු මඩ 345හි කැබලි අංක 6, හිමිකම් පිඹුරු 47624 සහ මෙම පිඹුරේ කැබලි අංක 4 ද ;

*නැගෙනහිරට* : මෙම පිඹුරේ කැබලි අංක 4, 5 සහ මූලික පිඹුරු මඩ 345හි කැබලි අංක 6 ද ;

*දකුණට* : මූලික පිඹුරු අංක මඩ 345 හි කැබලි අංක 6, තලවයිකාඩු රජයේ ඉඩම සහ මෙම පිඹුරේ කැබලි අංක 7 සහ 8 ; සහ

*බටහිරට* : තලවයිකාඩු රජයේ ඉඩම, මෙම පිඹුරේ කැබලි අංක 7 සහ 8, මූලික පිඹුරු මඩ 345 හි කැබලි අංක 6 සහ හිමිකම් පිඹුරු 47624.

යන මායිම් තුළ පිහිටි අක්කර එකසිය විසිපහයි රූඩ් දෙකයි පර්චස් හතර (අ. 125. රූ. 02, පර්. 4.0) ක් හෙවත් හෙක්ටයාර් පනහයි දශම හතයි නවයයි හතයි තුන (හෙක්ටයාර් 50.7973) කින් සමන්විත වූ කැබලි අංක 6 ලෙස සලකුණු කර ඇති ඉහත කී බෙදා වෙන්කළ ඉඩම් කොටස වේ.

**කැබලි අංක 10**

*උතුරට* : මෙම පිඹුරේ කැබලි අංක 9 ;

*නැගෙනහිරට* : මෙම පිඹුරේ කැබලි අංක 9, තලවයිකාඩු රජයේ ඉඩම සහ හිමිකම් පිඹුරු 170368 ;

*දකුණට* : තලවයිකාඩු රජයේ ඉඩම, හිමිකම් පිඹුරු 170368, මූලික පිඹුරු මඩ 345 හි කැබලි අංක 6 සහ මෙම පිඹුරේ කැබලි අංක 9 ; සහ

*බටහිරට* : මෙම පිඹුරේ කැබලි අංක 9.

යන මායිම් තුළ පිහිටි අක්කර දෙකයි පර්චස් දෙකයි දශම හත (අ. 2, රූ. 0, පර්. 2.7) ක් හෙවත් හෙක්ටයාර් බින්දුවයි දශම අටයි එකයි හයයි එක (හෙක්ටයාර් 0.8161) කින් සමන්විත වූ කැබලි අංක 10 ලෙස සලකුණු කර ඇති ඉහත කී බෙදා වෙන්කළ ඉඩම් කොටස වේ.

**කැබලි අංක 12**

*උතුරට* : මාර්ග සංවර්ධන අධිකාරිය සතු පාර, මූලික පිඹුරු මඩ 345 හි කැබලි අංක 6 සහ මෙම පිඹුරේ කැබලි අංක 11 ද ;

*නැගෙනහිරට* : මූලික පිඹුරු මඩ 345 හි කැබලි අංක 6 සහ මෙම පිඹුරේ කැබලි අංක 11 ද ;

*දකුණට* : මූලික පිඹුරු මඩ 345 හි කැබලි අංක 6 ද ; සහ

*බටහිරට* : මාර්ග සංවර්ධන අධිකාරිය සතු පාර සහ මූලික පිඹුරු මඩ 345 හි කැබලි අංක 6 ද.

යන මායිම් තුළ පිහිටි අක්කර පහළොවයි රූඩ් දෙකයි පර්චස් දෙකයි දශම හත (අ. 15, රූ. 2, පර්. 2.7) ක් හෙවත් හෙක්ටෙයාර් හයයි දශම දෙකයි හතයි නවයයි හතර (හෙක්ටයාර් 6.2794) කින් සමන්විත වූ කැබලි අංක 12 ලෙස සලකුණු කර ඇති ඉහත කී බෙදා වෙන්කළ ඉඩම් කොටස සහ 2020 ජුනි මස 24 වන දිනැති මූලික පිඹුරු මඩ 3017 දරන පිඹුරට අනුව එකී කැබලි අංක 01, 06, 10 සහ 12 හි මුළු බිම් ප්‍රමාණය අක්කර දෙසීයයි පර්චස් බින්දුවයි දශම හය (අ. 200, රූ. 0, පර්. 0.6) ක් හෙවත් හෙක්ටයාර් අසූවයි දශම නවයයි තුනයි හතයි එක (හෙක්ටයාර් 80.9371) ක් වූ ඉහත කී ඉඩම වේ.

EOG 03 - 0115

**1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත**

22අ වගන්තිය යටතේ වූ නියමය

සංශෝධිත 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 22අ වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති රනිල් වික්‍රමසිංහ වන මම, මෙහි පහත සඳහන් උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ප්‍රදේශය, මේ පනතේ කාර්යය සඳහා බලපත්‍රලත් කලාපයක් ලෙස මේ නියමය මගින් මෙයින් ප්‍රකාශයට පත් කරමි.

**රනිල් වික්‍රමසිංහ,**
ජනාධිපති.

2023 මාර්තු මස 07 වැනි දින,
කොළඹ,
ජනාධිපති කාර්යාලයේ දී ය.

***උපලේඛනය***

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, එරාවූර් පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 193, තලවයි ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පුන්නෙයික්කුඩා ග්‍රාමයේ පිහිටා ඇත්තාවූ ද පුන්නෙයික්කුඩා තෝට්ටම් යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම සඳහා සර්වේයර් ජනරාල්වරයා විසින් පිළියෙල කරන ලද 2021 ජනවාරි මස 26 වන දිනැති මූලික පිඹුරු මඩ 3067 දරන පිඹුරේ කැබලි අංක 1 සහ 4 ලෙස ලකුණු කර නිරූපණය කර ඇත්තා වූ ද,

**කැබලි අංක 1**

| | |
|---|---|
| *උතුරට* | : මූලික පිඹුරු මඩ 3017 හි කැබලි අංක 1 සහ තලවයිකාඩු රජයේ ඉඩම ද ; |
| *නැගෙනහිරට* | : තලවයිකාඩු රජයේ ඉඩම ද ; |
| *දකුණට* | : තලවයිකාඩු රජයේ ඉඩම සහ මෙම පිඹුරේ කැබලි අංක 2 ද ; සහ |
| *බටහිරට* | : මෙම පිඹුරේ කැබලි අංක 2, මූලික පිඹුරු මඩ 3017 හි කැබලි අංක 1 සහ 3 ද. |

යන මායිම් තුළ පිහිටි අක්කර තිස්නවයයි රූඩ් දෙකයි පර්චස් හත (අ. 39, රූ. 02, පර්. 07.0)ක් *හෙවත්* හෙක්ටයාර් දහසයයි දශම බින්දුවයි බින්දුවයි දෙකයි පහ (හෙක්ටයාර් 16.0025) කින් සමන්විත වූ කැබලි අංක 01 ලෙස සලකුණු කර ඇති ඉහත කී බෙදා වෙන්කළ ඉඩම් කොටස වේ.

**කැබලි අංක 4**

| | |
|---|---|
| *උතුරට* | : මූලික පිඹුරු මඩ 3017 හි කැබලි අංක 6 සහ 4 සහ මෙම පිඹුරේ කැබලි අංක 3 ද ; |
| *නැගෙනහිරට* | : මෙම පිඹුරේ කැබලි අංක 03 සහ තලවයිකාඩු රජයේ ඉඩම ද ; |
| *දකුණට* | : තලවයිකාඩු රජයේ ඉඩම, මෙම පිඹුරේ කැබලි අංක 5, භූලක්ෂණාත්මක පිඹුරු අංක 298482 සහ භූලක්ෂණාත්මක පිඹුරු අංක 174579 ද ; සහ |
| *බටහිරට* | : මෙම පිඹුරේ කැබලි අංක 5, භූලක්ෂණාත්මක පිඹුරු අංක 298482, භූලක්ෂණාත්මක පිඹුරු අංක 174579, තලවයිකාඩු රජයේ ඉඩම සහ මූලික පිඹුරු මඩ 3017 හි කැබලි අංක 6 ද, |

යන මායිම් තුළ පිහිටි අක්කර පහළොවයි රූඩ් දෙකයි පර්චස් තිස් අටයි දශම නවය (අ. 15, රූ. 02, පර්. 38.9) ක් හෙවත් හෙක්ටයාර් හයයි දශම තුනයි හතයි බින්දුවයි නවය (හෙක්ටයාර් 6.3709) කින් සමන්විත වූ කැබලි අංක 04 ලෙස සලකුණු කර ඇති ඉහත කී බෙදා වෙන්කළ ඉඩම් කොටස සහ 2021 ජනවාරි මස 26 වන දිනැති මූලික පිඹුරු මඩ 3067 දරන පිඹුරට අනුව එකී කැබලි අංක 01 සහ 04 හි මුළු බිම් ප්‍රමාණය අක්කර පනස් හයයි රූඩ් එකයි පර්චස් පහයි දශම නවය (අ. 55, රූ. 1, පර්. 5.9) ක් හෙවත් හෙක්ටයාර් විසි දෙකයි දශම තුනයි හතයි තුනයි හතර (හෙක්ටයාර් 22.3734) ක් වූ ඉහත කී ඉඩම වේ.

EOG 03 - 0115/1

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.